# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 14,713 — 1966 සැප්තැම්බර් 16 වැනි සිකුරාදා — 1966.9.16**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# II වැනි කොටස — අධිකරණ

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| සම්මත වූ පනත් ... ... ... | — | පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම ... ... | 136 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම ... ... ... | — | බුදල් නඩු පිළිබඳ දැන්වීම ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු හැසි පිළිබඳ නිවේදන ... | — | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම ... ... ... | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම ... | 135 | නොතාරිස් ලැයිස්තුව ... ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම ... ... | — | විවිධ දැන්වීම ... ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන් පත් කිරීම ... ... | — | | |


## දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම

### මහේස්ත්‍රාත් උසාවිය, කුලියාපිටිය

**වටිනාකමක් නැති ලේඛන විනාශ කිරීම**

මෙම උසාවියට අයත්, පහත විස්තරකර ඇති වටිනාකමක් නැති නඩු ලේඛන, අද දින සිට තුන් මාසයක් ඉක්ම ගිය පසු, විනාශ කරනු ලබන බව මෙයින් දනුම් දෙනු ලැබේ.

2. මෙම නඩු සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන අයෙකු සිටී නම්, පුද්ගලිකව හෝ, නීතිඥයෙකු මාර්ගයෙන් හෝ, නිසි පරිදි සකස් කරන ලද පෙත්සමක මාර්ගයෙන්, එම නඩුව හෝ නඩු විනාශ නොකිරීමට සෑහෙන හේතු ඉදිරිපත් කළ යුතුයි.

නඩු ලේඛන වල විස්තර :

| කාලය | | නඩු අංක |
|---|---|---|
| 1.6.48—30.6.52 | ... | ... 1—සිට 10100 |
| 1.7.48—31.5.53 | ... | ... 1—සිට 2608 |

ජී. ඇෆ්. එච්. අතුරුපාන,
මහේස්ත්‍රාත්, කුලියාපිටිය.

මහේස්ත්‍රාත් උසාවිය,
කුලියාපිටිය,
1966 සැප්තැම්බර් මස 4 දින.

9–695

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පලකිරීම සඳහා එවනු ලබන දැන්වීම පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් එය එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1966 ජූලි මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

# පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම්

## බස්නාහිර පළාත

### කලුතර දිස්ත්‍රික් නඩු ශාලාවේදීය

**නැසීගිය යකුබු මරික්කාර් නබීසා උම්මාගේ මුදලය සම්බන්ධවය.**

දේශීය ආදායම් කොමසාරිස් .............................. පෙත්සම්කරු.

අංක : 3750 පී. එදිරිව

දකුණු කලුතර, මූවර් වීදියේ, අංක 25 දරන ස්ථානයේ පදිංචි නැසීගිය අයගේ මුදල් බල[illegible]රයා වන සහීබ් දෙරේ මොහමඩ් සාලි මරික්කාර්............................................වග උත්තරකරු.

මෙහි පහත සඳහන්වන දේපලවලින් ඉහත කී නඩුවේ ඉහත සඳහන් නැසීගිය අයට තිබෙන අයිතිවාසිකම් සහ ප්‍රයෝජනයත්, වර්ෂ 1966ක්වූ ඔක්තෝබර් මස 7 වැනි දින, සිකුරාදා, පෙරවරු 10.30 ට එම ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

පහත සඳහන් ඉඩම විකුණනු ලබන්නේ රුපියල් අටසිය අසූවක් හා එම මුදලට 1962.2.2 දින සිට ගෙවනතෙක් 4% පොලිය; පිස්කල් ගාස්තු හා පවුණ්ඩේජ් ගාස්තු අයකර ගැනීමටය.

බස්නාහිර පළාතේ, කලුතර දිස්ත්‍රික්කයේ, කලුතර තොටමුනේ මහ හීනටියන්ගල පිහිටි දවටගහවත්ත හෙවත් දූවෙ වත්ත සහ ඹවිට නමැති ඉඩමේ අංක ඒ, ඒ1, බී, බී1, සී, සී1, ඩී, ඩී1, ඊ සහ ඊ1 දරන යාබද කොටස්වලට මායිම් :— උතුරට : අලුත්වැඩියා නොකරන ලද ගම්සභා පාර සහ කුඹුර; බස්නාහිරට : ඇල; දකුණට : මහ හීනටියන්ගල පදිංචි ඇස්. ඒ. ඊබ්‍රාහිම් නමැති අයට අයිති මාදන්ගහ වත්ත නමැති ඉඩම; නැගෙනහිරට : පල්ලියවත්ත නමැති ඉඩම යන මෙකී මායිම් තුළ පිහිටි අක්කර තුනයි, රූඩ් දෙකකි (අ. 3, රූ. 2, ප. 0) ප්‍රමාණ වූ ඉඩම හා එහි පිහිටි ගොඩනැගිලි හා වැවිලි.

ස. ද. සී. විතාරණ,
කලුතර නියෝජ්‍ය පිස්කල් වෙනුවට.

වර්ෂ 1966 සැප්තැම්බර් මස 4 වැනිදා,
කලුතර පිස්කල් කන්තෝරුවේ දීය.

9-666

---

## දකුණු පළාත

### තංගල්ලේ දිස්ත්‍රික් නඩු ශාලාවේදීය

වලස්මුල්ලේ පදිංචි ජයවීර පටබැඳිගේ බේබිසිඤෝනෝ.................................................................................. පැමිණිලිකාරයා.

නොම්මරය 7418 එදිරිව

වලස්මුල්ලේ, මුරුතවෙල පදිංචි ඒකනායක ආරච්චිගේ සවුන් අප්පුහාමි............................................ විත්තිකාරයා.

ප්‍රසිද්ධ නොතාරිස් ලයනල් ද සිල්වා ජයසූරිය විසින් සහතික කරන ලද අංක 1964 හා 1956.10.29 වෙනි දින දරන ඔප්පුවෙන් පැමිණිලිකරුට උකස් කරන ලද 1964.6.8 වෙනි දින දරන නඩු තීන්දු වෙන් විකිණිය හැකි ලෙස ප්‍රකාශ කරන ලද 1964.11.24 වෙනි දින දරන උසාවියේ නියෝගයෙන් විකුණන ලෙස නියෝග කරන ලද මෙහි පහත සඳහන් වන දේපලවලින් ඉහත කී නඩුවේ විත්තිකරුට තිබෙන අයිතිවාසිකම් සහ ප්‍රයෝජනයත් වර්ෂ 1966ක්වූ ඔක්තෝබර් මස 8 වැනි සෙනසුරාදා පෙරවරු 10 ට එකී ඉඩම්වලදී රුපියල් 1,132.75 ක් සහ 1964.11.24 වෙනි දින සිට ගෙවන දින තෙක් රුපියල් 1,007.50 ක් සඳහා නීති පොලිය වන සියයට 5% පොලියද අයකර ගැනීම සඳහා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

1. දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ උතුරු ගිරුවා පත්තුවේ මුරුතවෙල පිහිටි උතුරට : කඳමගආත්තාගේවත්ත; නැගෙනහිරට : හීල්ලගෙපැලවත්ත; දකුණට : ඇල්පිටගෙවත්ත නොහොත් මුදුන්වත්ත සහ බස්නාහිරට : බෙලිගල්ලගෙවත්ත යන මායිම් තුළ වූ කුරක්කන් කුරිණි 6ක් පමණ වපුරන වපසරිය ඇති දංගහවත්ත නමැති ඉඩමේ බිමෙන් සහ වගාවෙන් නොබෙදූ ⅓ පංගුවක්.

2. ඉහත කී මුරුතවෙල පිහිටි උතුරට : අම්බලගේවත්ත; නැගෙනහිරට : හීල්ලගෙවත්ත; දකුණට : බීරගෙවත්ත සහ බස්නාහිරට : මාරගහවත්ත සහ දමනියගහවත්ත යන මායිම් තුළ වූ කුරක්කන් කුරිණි 3 ක් වපුරන වපසරිය ඇති මැකිලියගහවත්ත නමැති ඉඩමේ බිම සහ වගාව.

එල්. එම්. ආරියපාල,
අතිරේක නියෝජ්‍ය පිස්කල්, තංගල්ල.

වර්ෂ 1966 සැප්තැම්බර් මස 7 වැනි දින,
තංගල්ලේ පිස්කල් කන්තෝරුවේ දීය.

9-710

---

## ඌව පළාත

### රත්නපුර දිස්ත්‍රික් නඩු ශාලාවේදීය

බලංගොඩ කේ. ඇම්. මොහමඩ් ........................ පැමිණිලිකාරයා.

නොම්මරය 3987 එදිරිව

හපුතලේ හප්තලේ ගම කොස්කණුවේ අලුත් වලව්වේ ඒ. ඩබ්ලිව්. ඇම්. කරුණාරත්න බණ්ඩාර .................................... විත්තිකාරයා.

මෙහි පහත සඳහන්වෙන දේපලවලින් ඉහත කී නඩුවේ විත්තිකරුට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් වර්ෂ 1966ක්වූ ඔක්තෝබර මස 14 දින පෙරවරු 11.30 පැයට පහත සඳහන් ඉඩමේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ. එනම් : රුපියල් දෙදහස් පන්සියයක් අයකර ගැනීම පිණිස :

ඌව දිසාවේ බදුලු දිස්ත්‍රික්කයේ මැදිකිඳ මහපළාත කෝරළේ හපුතලේ ගම පිහිටි, කොස්කණුවේ අලුත් වලව්වෙ අක්කර බාගයක පමණ විශාල ඉඩමට මායිම් :—උතුරට සහ බස්නාහිරට : ගම්සභා පාර ද; නැගෙනහිරට : පන්සල[illegible] අයිති ඉඩමේ මායිම ද; දකුණට : ඇළ ද යන මෙහි තුළ ඉඩම සහ එහි තුළ තිබෙන උලු සෙවිලි ගොඩනැගිල්ල ද යන මෙකී දේපල වේ.

විල්ප්‍රඩ් ඇලෙක්සැන්ඩර් සෙනරත්,
ඌව පළාතේ අතිරේක නියෝජ්‍ය පිස්කල්.

වර්ෂ 1966 අගෝස්තු 22,
බදුලු පිස්කල් කන්තෝරුවේ දීය.

9-672

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස්වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් බාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පලකල යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් බාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙලින්ම යැවිය යුතුය.

### උපලේඛනය

**1966**

| මාසය | | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|---|
| අගෝස්තු | ... | 66. 8.19 | සිකුරාද | ... | 66. 8.12 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 8.26 | සිකුරාද | ... | 66. 8.19 | සිකුරාද | ප.ව. 3.30 |
| සැප්තැම්බර් | ... | 66. 9. 2 | සිකුරාද | ... | 66. 8.26 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 9. 9 | සිකුරාද | ... | 66. 9. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 9.16 | සිකුරාද | ... | 66. 9. 9 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 9.23 | සිකුරාද | ... | 66. 9.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 9.30 | සිකුරාද | ... | 66. 9.23 | සිකුරාද | ප.ව. 3.30 |
| ඔක්තෝබර් | ... | 66.10. 7 | සිකුරාද | ... | 66. 9.30 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.10.14 | සිකුරාද | ... | 66.10. 7 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.10.20 | බ්‍රහස්පතින්ද | ... | 66.10.14 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.10.27 | බ්‍රහස්පතින්ද | ... | 66.10.20 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| නොවැම්බර් | ... | 66.11. 3 | බ්‍රහස්පතින්ද | ... | 66.10.27 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | | 66.11.10 | බ්‍රහස්පතින්ද | ... | 66.11. 3 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | | 66.11.18 | සිකුරාද | ... | 66.11.10 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | | 66.11.25 | සිකුරාද | ... | 66.11.18 | සිකුරාද | දවල් 12 |
| දෙසැම්බර් | ... | 66.12. 2 | සිකුරාද | ... | 66.11.24 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | | 66.12. 9 | සිකුරාද | ... | 66.12. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.12.16 | සිකුරාද | ... | 66.12. 8 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | | 66.12.23 | සිකුරාද | ... | 66.12.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.12.30 | සිකුරාද | ... | 66.12.22 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |

1966 ජුලි 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංස්ථාවෙහි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි